## සොයා බලා පිහිටට එන කෙනෙක් නැත
## වකුගඩු ලෙඩෙන් අපි මැරුණත් කමක් නැත!



රජරට වකුගඩු මාරයා හෙවත් මේ බිම වනසන කෘෂි රසායන සහ පලිබෝධක නාශක ත්‍රස්තවාදයට සුදු හුණු ගෑමේ අධම ක්‍රියාවලිය දැන් තවත් වටයකින් ආරම්භ වී තිබෙන බව මේ වන විට වාර්තා වෙමින් තිබේ. මෙවර එය සිදු වෙමින් තිබෙන්නේ කෙසේද?

රජරට ගොවි ජනතාව පරලොව යැවූ නිධන්ගත වකුගඩු රෝගය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානය සිදු කළ විමර්ශනයේ අවසන් වාර්තාව නිකුත් කෙරුණේ නොබෝදාය. මෙම විමර්ශනය සඳහා වැය කෙරුණු මුදල රුපියල් මිලියන සියයක් පමණ වූ බවද ඉකුත් දිනවල කියැවිණි.

මෙකී විමර්ශනයේදී වකුගඩු ලෙඩ කර රජරට ජනතාව බිලිගින්නා ත්‍රස්තවාදියා කවරෙක්දැයි. එම සංවිධානය පැහැදිලි ලෙසම හඳුනා ගත්තේය. නමුත් ගැටලුව ඇත්තේ ඒ බව එළිපිට කියන්නට ලෝක සෞඛ්‍ය සංවිධානය මැලි වී සිටීමය.

අප එසේ කියන්නේ ඇයි? එම සංවිධානය මගින් නිකුත් කර ඇති අවසන් වාර්තාව පිළිබඳ අවධානය යොමු කිරීමේදී එය පැහැදිලිව පෙනෙන්නකි. ඔවුන් යකා හඳුනා ගත්තද සෑම කරුණක්ම අනාවරණය කර ඇත්තේ දෙකටම නැති න්‍යායෙනි.

මේ වන විට අප ඉහත කී පරිදි කෘෂි රසායන ත්‍රස්තවාදයට නැවත වරක් සුදු හුණු ගෑමේ නින්දිත ක්‍රියාවලිය ඇරඹී ඇත්තේද ලෝක සෞඛ්‍ය සංවිධානයේ මෙම දෙකටම නැති න්‍යාය හමුවේ බවද කිවයුතුව තිබේ.

සිය විමර්ශනයේදී කෘෂි රසායන සහ පලිබෝධ නාශකවල අඩංගු ආසනික් ඇතුළු වස විෂ පිළිබඳව මෙන්ම රසායන පොහොරවල ඇති කැඩ්මියම් ආදී බොහෝ දේ සම්බන්ධව තොරතුරු අනාවරණය කර ගන්නට ලෝක සෞඛ්‍ය සංවිධානය සමත්ව ඇති බව ඔවුන්ගේ අවසන් වාර්තාව දෙස බැලීමේදී පැහැදිලි වේ.

නමුත් එකී වස විෂ මිනිස් සිරුරේ වකුගඩු අක්‍රීය වීමේ සිට හෘදයාබාධ, දියවැඩියාව ආදී වශයෙන් වූ බෝ නොවන රෝග ගණනාවක් වැළඳීම සඳහා ප්‍රබල සාධක වන බව දැන දැනත් ඔවුන් අවසානයට පවසා ඇත්තේ රජරට වකුගඩු රෝගයට හේතුව අදාළ වස විෂ විය හැකිය යන්න පමණකි.

මේ එලොවටත් නැති මොලොවටත් නැති ප්‍රකාශයක් බව අමුතුවෙන් කිව යුතු නොවේ. විශාල මුදලක් වැය කර අධියර කිහිපයක් ඔස්සේ සිදු කෙරුණු පුළුල් විමර්ශනයකින් අනතුරුව ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි ලොවම පිළිගත් ආයතනයක් වෙතින් අවසානයට නිකුත් විය යුත්තේ මෙවන් වාර්තාවක්ද?

මෙයින් නොකියා කියැවෙමින් තිබෙන්නේ කිසියම් නිමිත්තක් හමුවේ ලෝක සෞඛ්‍ය සංවිධානයද සිය විමර්ශනය තුළින් අපට කොළේ වසා ගැසීමේ උත්සාහයක් ගෙන තිබෙන බවද? තවත් අකාකාරකින් බලන කල අද අපට එසේ විමසීමට සිදුව ඇත්තේ රජරට ගොවීන් බිලි ගන්නා කෘෂි රසායන ත්‍රස්තවාදයේ ආසනික් නිමිත්ත දැක දැකත් එම සංවිධානය අතාර්කික අයුරින් කැඩ්මියම් කතාවක් දෙසට දැඩිව අප රැගෙන යැමේ උත්සාහයක් ගෙන තිබෙන බැවිනි.

අද දවසේ කෘෂි රසායන ත්‍රස්තවාදයට සුදුහුණු ගෑමට පෙළ ගැසී සිටින කුමන්ත්‍රණකරුවෝ මෙකී කැඩ්මියම් කතාවද බරපතළ ලෙස ප්‍රයෝජනයට ගනිමින් සිටින බව අනාවරණය වෙමින් තිබෙන්නකි. එහිදී ඇතැම් මාචාර්ය සට්ටඹියෝ කෘෂි රසායන ත්‍රස්තවාදියා කිසිදු හිරිකිතයක් නොමැතිවම මෙම කැඩ්මියම් සිදුරෙන් රිංගා යැවීමට ම්ලේච්ඡ උත්සායක්ද දරමින් සිටිති.

අප එය ම්ලේච්ඡ උත්සාහයක් ලෙස හඳුන්වන්නේ ඇයි. හඳුනා නොගත් බවට මේ මොහොතේත් කියන රජරට වකුගඩු මාරයාට දැඩිලෙස ගොදුරු වූයේ එම ප්‍රදේශවල ජනතාවය. නැතහොත් මේ රටට බත සැපයූ ගොවි ජනතාවය. කෙටියෙන්ම කිවහොත් මඩ සෝදාගත් කල රජකමට සුදුසු යැයි කියමින් අප උදම් ඇනූ අපේ ගොවි රජවරුන්ය.

ඔවුන් මෙකී ව්‍යසනයේ ගොදුරු බවට පත්වීමේ ආරම්භය මීට දශක දෙකහාමාරක් පමණ වූ අතීතයකට ඇදී යන්නකි. ඒ ආරම්භයේ තත්ත්වය තිබුණේ එතරම් දරුණු මට්ටමක නොවීය. එහෙත් අතීත ආරම්භය එසේ වුවද වර්තමානයේ එය පවතින්නේ කොතැනකද?

එකල මෙම මාරාන්තික වකුගඩු රෝගයට ගොදුරු වූවෝ වැඩිහිටි ගොවීන් වූහ. එහෙත් එකී තත්ත්වය මේ වන විට තරුණ පරපුර දක්වාම පැතිර ගොස් තිබෙන්නකි. අද දවසේ රජරට ජනතාව ස්ත්‍රී පුරුෂ හෝ වයස් බේදයකින් තොරවම මෙකී මාරයාට ගොදුරු වෙමින් සිටින බව මේ වන විට අනාවරණය වී ඇත්තේය.

එසේම මෙතෙක් රජරට වකුගඩු මාරයාට ගොදුරු වූ මිනිසුන්ගේ ප්‍රමාණය සංඛ්‍යාත්මක දැක්වීමට ලේඛනගත තොරතුරු කිසිවක්ද අපට නොවේ. එකී බිලිවීම දසදහස් ගණනින් සිදුව ඇති බව පමණක් දළ වශයෙන් කිවහැකිව තිබේ. මේ

මොහොත වන විට මෙකී වකුගඩු මාරයාට ගොදුරු වී රෝගීන් බවට පත්ව සිටින පිරිසද නිවැරදිව හඳුනා ගන්නට ක්‍රමවේදයක් රටට නැත්තේය.

එවන් පසුබිමක් යටතේ දැනට හඳුනාගෙන ඇති රජරට ජනතාව මරා දමන කෘෂි රසායන ත්‍රස්තවාදයට මොනයම්ම ආකාරයකින් හෝ ගැලවී යැමට හැකි පසුබිම අප අතරේම සිටින කෙනකු නරුමයකු සකසන්නේ නම් එය ම්ලේච්ඡ ක්‍රියාවක්ම නොවන්නේද?

දැනට හෙළිදරව් වන අන්දමට ඉහත කී මහාචාර්ය සට්ටඹියන් අද දවසේ රජරට ගොවීන් මරා දැමූ කෘෂි රසායන ත්‍රස්තවාදියා නැවතත් මෙකී කැඩ්මියම් සිදුරෙන් රිංගා යැවීමේ කුමණ්ත්‍රණය ක්‍රියාත්මක කර ඇත්තේ කෙසේද?

කැඩ්මියම් යනු කෘෂි රසායන සහ පලිබෝධ නාශකවල අඩංගු විෂ තත්ත්වයක් නොවන බව දැනට පැහැදිලි වී තිබෙන්නකි. එහෙත් කෘෂි රසායන සහ පලිබෝධ නාශකවල ආසනික් ඇතුළු අනෙකුත් වස විෂ අඩංගු බව නම් මේ වන විට නිශ්චිතවම තහවුරු වී තිබේ.

කැඩ්මියම් අඩංගු බවට අනාවරණය වී ඇත්තේ රසායනික පොහොරවලය. ඉදින් ලෝක සෞඛ්‍ය සංවිධානය සිය අවසන් වාර්තාව මගින් රජරට වකුගඩු මාරයා පිළිබඳ විමර්ශන පවත්වා ආසනික් ඇතුළු බොහෝ දේ පිළිබඳ කතා කරන අතරේ එලොවටත් මොලොවටත් නොමැතිව කැඩ්මියම් කතාවක් දෙසට අප යොමු කිරීම තුළ පැහැදිලිවම සිදු වන්නේ කෘෂි රසායන සහ පලිබෝධ නාශක ත්‍රස්තයන්ට රජරට මිනිසුන් බිලි ගැනීමේ අවනඩුවෙන් ගැලවී යැමට පුංචි ඉඩක් හෝ නිර්මාණය කිරීම වේ. ලෝක සෞඛ්‍ය සංවිධානය සිය විමර්ශනයේදී කෘෂි රසායන සහ පලිබෝධ නාශකවල අඩංගු ආසනික් ඇතුළු වස විෂ පිළිබඳව කතා කර තිබෙන බව සැබෑවකි. නමුත් ඔවුන් සිය අවසන් වාර්තාව මගින් කැඩ්මියම් කතාවක් දෙසට අප යොමු කරවා තිබීම තුළ බොහෝ දුරට රජරට වකුගඩු රෝගයේ වැඩි වගකීම පැවරෙන්නේ රසායනික පොහොර වෙතටය. සැබෑ ත්‍රස්තවාදියාට වගකීමෙන් ගැලවීමේ පුංචි ඉඩක් නිර්මාණය වන්නේ එලෙසිනි.

අද දවසේ අප ඉහත කී ඇතැම් මහාචාර්ය සට්ටඹියන් ත්‍රස්තවාදීයා බේරා ගැනීමේ කුමන්ත්‍රණය දියත් කර ඇත්තේද එකී කරුණු ඔස්සේ වේ. එසේම ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉහතකී කැඩ්මියම් නැඹුරුව සමග රටට කියන්නට තවත් කතාවක්ද අපට තිබේ. ඒ කුමක්ද?

වර්තමානයේ මෙරට ගොවීන් අතට වැඩි වශයෙන් රසායනික පොහොර ලැබෙන්නේ රජයේ පොහොර සහනාධාරය ඔස්සේය. එසේ නම් කෘෂි රසායන සහ පලිබෝධ

නාශක ත්‍රස්තවාදීන් පිළිබඳව කතාකරන අතරේම කැඩ්මියම් කතාවක් පෙරට දමා ලෝක සෞඛ්‍ය සංවිධානය රසායනික පොහොර යන සාධකය ගෙන දඬුකඳේ ගැසීමට සැරසෙන්නේ කුමක් අරබයාද?

ඒ තුළ ඇත්තේ පොහොර සහනාධාරය ලබාදීම හමුවේ රජරට වකුගඩු රෝගයේ වැඩි වගකීම රජය පිටටම පැටවීමද? මේ මොහොතේ එය දැඩි ලෙස රජයේ අවධානය යොමු විය යුතු කරුණක් බවද කිවයුතුව ඇත්තේය. අප එසේ කියන්නේ මේ වන විටත් කෘෂි රසායන ත්‍රස්තයන් මෙතෙක් තමන් වටා සිටි දේශෙදුdaහීන්ද සමග එක්ව තමන්ගේ ගැලවීම අරබයා එවන් මතවාදයක් පැතිරවීමේ උත්සාහක් දරමින් සිටින බව අනාවරණය වෙමින් තිබෙන නිසාය.

සිය විමර්ශනයේදී රජරට ජනතාවගෙන් සියයට අනූවකගේ හිසකෙස්වලත් සියයට හැටකගේ නියපොතුවලත් ආසනික් අඩංගු බවට හෙළිවූ බව ලෝක සෞඛ්‍ය සංවිධානයම කියා ඇත්තේය. එසේම තවත් තැනකදී ඔවුන් වකුගඩු රෝගයට ගොදුරු වී මියගිය රජරට මිනිසුන්ගේ සිරුරු කපා කළ වකුගඩු පරීක්ෂා කිරීම්වලදී ඉහළ ආසනික් ප්‍රමාණයක් නිරීක්ෂණය වූ බවද කියන්නේය. ඒ කියන අතරේ වකුගඩු රෝගයට ගොදුරු වී සිටින රජරට මිනිසුන් මුත්‍රා සමග ඉහළ ආසනික් ප්‍රමාණයක් පිට කරන බවක්ද තවත් තැනකදී කියන්නේය.

මේ ආසනික් යන්න බහුල ලෙස අඩංගු වී තිබුණේ කෘෂි රසායන සහ පලිබෝධ නාශකවල බව මේ වන විට ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඇතැම් ප්‍රකාශයන් තුළින්ද නිශ්චිතවම තහවුරු වී තිබෙන්නකි.

එසේ තිබියදී ඔවුන් කැඩ්මියම් කතාවක් දෙසට අතාර්කික ලෙසින් අප ඇගෙන යෑමේ උත්සාහක් දරා ඇති බව පැහැදිලි ලෙසම පෙනී යන බව මෙහි මුලින්ද අපි සටහන් කෙරුවෙමු. ලෝක සෞඛ්‍ය සංවිධානය එසේ අතාර්කික ලෙසින් ක්‍රියාත්මක වී ඇතැයි අප කියන්නේ ඇයි.

අප එසේ පවසන්නේ සිය අවසන් වාර්තාව මගින් කැඩ්මියම් කතාවක් දෙසට අප ඇගෙන යන එම සංවිධානය එහිදී ගෙනහැර දක්වන කරුණු පිළිබඳ අවධානය යොමු කරමිනි. කැඩ්මියම් පිළිබඳ කතාකරන ලෝක සෞඛ්‍ය සංවිධානය එහිදී Rජුවම චෝදනා නගන්නේ රජරට වැව්වල සිටිනා මත්ස්‍යයින් වෙතටය.

රජරට වැව්වල සිටින මාළුන්ගේ සිරුරුවල මෙන්ම එම ප්‍රදේශයේ ජනතාව භාවිතයට ගන්නා එළවළුවලද අධික ලෙස කැඩ්මියම් අඩංගු බවට විමර්ශනයේදී හෙළි වූ බව එම සංවිධානය සිය අවසන් වාර්තාව මගින් ප්‍රකාශ කර ඇත්තේය.

නමුත් ගැටලුව ඇත්තේ රජරට මාලුන්ගේ සිරුරුවලට එසේ කැඩ්මියම් ඇතුළු වූයේ

කෙසේද යන්න ලෝක සෞඛ්‍ය සංවිධානය කොතැනකදීවත් අනාවරණය නොකිරීමය.

රජරට ගොවියා තොග පිටින් ගෙන මේ මහ පොළොව මත හෙලූ කෘෂි රසායන සහ පලිබෝධ නාශ තුළ ආසනික් අඩංගු වූ බව අද පැහැදිලිව අනාවරණය වී තිබෙන අතරේ රජරට ජනතාවගේ හිසකෙස් සහ නියපොතුවල මෙන්ම මියගිය ගොවීන්ගේ වකුගඩුවලත් ඒ ආසනික් තිබූ බවට ලෝක සෞඛ්‍ය සංවිධානයම තහවුරු කරද්දී රජරට මාලුන්ගේ සිරුරවලට කැඩ්මියම් ඇතුළු වූයේ කෙසේද යන්න පැහැදිලිව අනාවරණය නොවන්නේ ඇයි?

ලෝක සෞඛ්‍ය සංවිධානයට සිය විමර්ශනයේදී එය නිශ්චිතව හෙළිදරව් කර ගැනීමට නොහැකි වන්නේ ඇයි. අඩුම තරමේ රසායනික පොහොර භාවිතය නිසා හෝ එවැන්නක් සිදුවූ බවට ඔවුන්ට නිගමනය විය යුතුව තිබිණි. නමුත් එවැන්නක් සිදුවී නොමැත්තේය.

ගමේ භාෂාවෙන් කිවහොත් මේ සිදුව ඇත්තේ හතරබීරි කෙළියකි. එකී හතරබීරි කතාව සමග රජරට වකුගඩු මාරයා සොයා සිදු කළ විමර්ශනයේදී හමුවන ආසනික් නිසා කැඩ්මියම්හි ක්‍රියාකාරිත්වය ඉහළ ගොස් ඇති බවක්ද සිය වාර්තාව මගින් එම සංවිධානය තවත් තැනකදී පවසා ඇත්තේය. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ඉහත විමර්ශන වාර්තාව එලොවටත් මොලොවටත් නැති එකක්ම බව අපට යළිත් කීමට සිදුවන්නේ මෙවන් කතා හමුවේය.

සිය විමර්ශනයේදී ආසනික් කැඩ්මියම් ඇතුළු කෘෂි රසායන වස විෂ ගෙන තරාදියක දෙපසට දමා ඇති ලෝක සෞඛ්‍ය සංවිධානය දැන් කැඩ්මියම් පැත්ත බර වැඩි වී පහතට ගොස් ඇතැයි අපට කියන්නේය. නමුත් නියම යකා ඉන්නේ තරාදියේ උඩට ගොසිනි. ඒ යකා අන් කිසිවකුත් නොව කෘෂි රසායන සහ පලිබෝධ නාශක ත්‍රස්තවාදියාමය. එය අප මේ සියල්ල හමුවේ වටහාගත යුත්තකි. එකී වටහාගැනීමත් සමග රටක් වශයෙන් අප කළ යුතු වන්නේ කුමක්ද?

උඩගිය යකාට අපෙන් බේරී වාෂ්ප වීමට නොදී අල්ලා ගැනීමය. එසේ නොවුණහොත් තවදුරටත් මේ බිම වෙලා ගත් කෘෂි රසායන සහ පලිබෝධ නාශක ත්‍රස්තවාදය හමුවේ ජීවිතවලින් වන්දි ගෙවනුයේ අපේ මිනිසුන් බව මේ මොහොතේවත් වගකිව යුත්තන් වටහාගත යුතුමය. අප ඉහත කී අයුරින් කෘෂි රසායන ත්‍රස්තවාදීන් ගලවා ගැනීමට අපේම වූ ඇතැම් නරුමයන් පෙළගැසෙද්දී උන්ට එරෙහිව ජාතියට හිතැති ලෙස තවත් මානයකින් සිදුවන ක්‍රියාවලියක්ද මේ වන විට අනාවරණය වෙමින් තිබෙන්නේය. ඒ කුමක්ද? ලෝක සෞඛ්‍ය සංවිධානය සිය අවසන් වාර්තාව නිකුත් කිරීමට ටික කලකට ඉහත රජරට වකුගඩු මාරයා පිළිබඳ අතුරු වාර්තාවක් නිකුත් කරනු ලැබීය. එහිදී කියැවෙන්නට වූ කරුණු හමුවේ රජය සිදු කළේ රජරට වකුගඩු මාරයා පිළිබඳ සොයා

බැලීම සඳහා රටේ උත්තරීතර ආයතනය වූ පාර්ලිමේන්තුවද සම්බන්ධ කර ගනිමින් පාර්ලිමේන්තු කාරක සභාවක් පත් කිරීම විය.

එකී පාර්ලිමේන්තු කාරක සභාවේ නියෝග අනුව පසුව කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් පවතින තත්ත්වයට විසඳුම් සොයාබලා වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමින් මෙරට විද්වතුන් දසදෙනකුගෙන් යුත් විද්වත් කමිටුවක් පත් කරනු ලැබීය.

මේ වන විට එකී විද්වත් කමිටුවේ වාර්තාව කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත භාර දීමෙන් පසු පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව වෙතද ඉදිරිපත්ව ඇති බව දැනගන්නට තිබෙන්නකි. එහෙත් කනගාටුවට කරුණ වී ඇත්තේ වකුගඩු මාරයාගේ ගොදුරු වී රජරට ජනතාව මියැදීම පමණක් නොව කෘෂි රසායන වස විෂ හමුවේ රටේම ජනතාව රෝගීන් වන තත්ත්වයක් නිර්මාණය වී තිබියදීත් අදාළ වාර්තාව පාර්ලිමේන්තුව වෙත තවමත් ඉදිරිපත් නොවීමය.

රටම ගිලගත් මෙවන් ව්‍යසනයකදී මෙරට වගකිවයුත්තන්ගේ වගවීම තිබිය යුත්තේ මෙවන් තැනකද? අදාළ විද්වත් කමිටුව මෙලෙස ඉදිරිපත් කර තිබෙන වාර්තාව මගින් පාර්ලිමේන්තු කාරක සභාවට යෝජනා කර ඇති නිර්දේශ වන්නේ මොනවාද?

පලිබෝධ නාශක සහ කෘෂි රසායන භාවිතය හැකිතාක් අවම කරමින් අපේ සාම්ප්‍රදායික කෘෂිකර්මය වෙත රට යොමු කරවීම, ලොව නවීන තාක්ෂණය යොදාගනිමින් පලිබෝධ නාශක භාවිතයේදී ප්‍රමිතිකරණයක් ඇති කිරීම, කෘෂිරසායන සහ පලිsබෝධ නාශකවල අඩංගු බැර ලෝහ ඉවත් කිරීම සඳහා පලිබොAධ නාශක පනත ප්‍රකාර නියෝග පැනවීම, සෞඛ්‍ය නිලධාරින්ට සහ ග්‍රාම නිලධාරින් ඇතුළු රාජ්‍ය නිලධාරින්ට පලිබෝධ නාශක පනත අනුව ක්‍රියාත්මක වීමට බලතල පැවරීම සහ අවිධිමත් ලෙස පලිබොAධ නාශක පරිහරණය කරන්නන්ට සහ ඊට අනුබල දෙන්නන්ට නීති මගින් දැඩි පියවර ගැනීම ආදී කරුණු වැදගත් රැසක් ඊට ඇතුළත්ව ඇත.

එසේම උග්‍ර විෂ සහිත ග්ලයිපොසේට් (ٳකහවයදිaළe) වැනි කෘෂි රසායන ද්‍රව්‍ය තහනම් කිරීම දක්වාම ගමන් කළ යුතු බව විද්වත් කමිටුව සිය වාර්තාව මගින් විශේෂත්වයෙහිලා සඳහන් කර ඇති අතර මෙකී ග්ලයිපොසේට් වැනි කෘෂි රසායන යනු මෙරට ගොවීන් බහුලව භාවිත කරන උග්‍ර විෂ සහිත සමූහ සංහාරක කෘෂි රසායන බවද මේ වන විට අනාවරණය වී ඇත්තේය.

රටට හිතැති විද්වතුන් පිරිසක් මෙසේ යකා පිළිබඳ සොයා බලා කළ යුත්ත නිවැරදි ලෙස රටේ උත්තරීතර ආයතනය වෙත යොමු කරද්දී මේ වන විට කෘෂි රසායන ත්‍රස්තයන් ක්‍රියාත්මකව ඇත්තේ කෙසේද? උන් මේ මොහොත වන විට අදාළ නිර්දේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වලකාලීම සඳහා දැවැන්ත මෙහෙයුමක්

අරඹා ඇත්තේය.

එකී මෙහෙයුමට අනුව විටෙක රජයේ මැති ඇමැතීන් පසුපස යන ත්‍රස්තයන් තවත් විටෙක තමන්ට තහනම් පැනවුණහොත් රටේ කෘෂිකර්මය බිඳවැටෙතැයි කිඹුල් කඳුළු හෙලමින් රජය වෙත ලිපි ලියමින් සිටින බවද වාර්තා වන්නේය. මුන් මෙසේ තවදුරටත් උත්සාහ දරනුයේ කුමකටද? ඒ කෘෂිරසායන වස විෂ අපේම ගොවීන් ලවා තව තවත් මේ බිමට හෙළා සමස්ත ජාතියම වැනසීමටය.

එසේනම් දැන් සියල්ල හමුවේ රජය කළ යුත්තේ කුමක්ද? කෘෂි රසායන ත්‍රස්තවාදයට සැමදා කඬේ ගිය සහ අදටත් කඬේ යන බක පණ්ඩිතයන්ගේ කතා අසා සමස්ත ජාතියම වනසා දැමීමට ත්‍රස්තවාදියාට තවදුරටත් ඉඩ ලබා දීමද? නැතහොත් ඉහත විද්වත් කමිටු වාර්තාව කඩිනමින් ඉදිරියට ගෙන ඊට නිසි තැන දී මේ මර උගුලෙන් රට ගලවා ගැනීමද?

මහත්වරුනි සිතන්න. මේ මාරයා හමුවේ මියැදෙමින් සිටින්නේ අපේම මිනිසුන්මය. සිය දෙමාපියන් වකුගඩු මාරයා බිලිගත් කල්හි අනාත වන්නේ අපේම දරුවන්ය. අද දවසේ රජරට බිමේ ඇවිද යනවිට එසේ අසරණවූ දරු පැටවුන් සියගණනින් රැකවරණය ඉල්ලා හඬා වැටෙනු දැකීමට ලැබීම හද පාරවන්නක්ම වී තිබෙන්නේය.

සමන් ගමගේ